**2025-09-11 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 සැප්තැම්බර් මස 11 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජීරා ගීතානි වීරසේන මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**<u>01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම</u>**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා ඒක සභා සම්මත කරන්න. සංශෝධන තියෙනවනම් ඒවත් ඉදිරිපත් කරන්න.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**
පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන</u>**
ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, පසුගිය සති අන්තයේ දින 02ක් සබරගමු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ප්‍රධානින්ට ඒ කියන්නේ සභාපතිවරුන්ට සහ ලේකම්වරුන්ට අමාත්‍යාංශයෙන් විශේෂ නීතිමය වැඩමුළුවක් පැවැත්වුවා. ඒ නීතිමය වැඩමුළුව මොනතරම් වැදගත්ද කියනවනම් සහ අපි නොදන්නා කාරණාවන් කොච්චර නම් තියෙනවද කියලා තේරුණේ ඒ වැඩමුළුවට සම්බන්ධ වීම නිසා. ඉතින් කෑගල්ලේ සභාපතිවරයෙක් යෝජනා කළා ඒ අමාත්‍යාංශයේ නිළධාරින්ට සෑම සභාවකම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට මේ වැඩමුළුව පවත්වන්න කියලා. අපි සභාවලට අළුත්. නමුත් අපි අළුත්වුණාට අපිට හැගී ගිය කාරණය තමයි අපි මෙතෙක් කල් ඒ කියන්නේ කලින් සභාවලත් අපිට අයිති නැති වැඩ තමයි කරලා තියෙන්නේ. මොකද පළාත් පාලන ආයතන කියන්නේ ව්‍යවස්ථාපිත ආයතනයක්. ඒ ආයතනය තුළ චක්‍රලේඛ තියෙනවා, අණපනත් තියෙනවා, නීති රිති තියෙනවා නමුත් ඊට පිටින් තමයි අපි සමහර වැඩ කරලා තියෙන්නේ. හැබැයි ඒවා ගත්තොත් සමහර ඒවා තියෙනවා අපිට මානුෂිය හේතුන් මත කරන්න වෙලා තියෙනවා. උදාහරණයක් විදියට කිව්වොත් නියඟයක් ආවාට පස්සේ වතුර බෙදීම කරනවා. සභාවල අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, මන්ත්‍රීතුමියනුත් හැම සභාවකම හිතන්නේ එවැනි අවස්ථාවක වතුර බෙදන්න ඕනි සභාවෙන් කියලා. වීථි ලාම්පු දාන්න ඕනි සභාවෙන් කියලා. වීථි ලාම්පු දාන්න විදුලිබල මණ්ඩලේ ලයිට් කණු උඩ නගින්න ඕනි. මොකද ලයිට් කණුව විදුලි බල මණ්ඩලේ. අපිට අයිති නැති දෙයක්. එතකොට විදුලි බල මණ්ඩලය දැනුවත් කරලා ඒ හරහා තමයි අපි කර ගන්න ඕනි. වතුර බෙදන්න ඕනි කවුද. වතුර බෙදන්න ඕනි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ ඒකකය මගින්. අපේ බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගත්තොත් වතුර බෙදන ට්‍රැක්ටරේ අවුරුදු 04කින් ස්ටාර්ට් කරලවත් නැහැ. අපි ඇවිල්ලා ප්‍රාදේශීය ලේකම්ට කතා කරලා කිව්වා අපිට වතුර බෙදන්න නීතිමය ප්‍රතිපාදන නැහැ ඒ නිසා මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්ම කරන්න කියලා. හැබැයි අපි කරනවනම්, ඒ කියන්නේ සභාවෙන් කරනවනම් අපිට ප්‍රතිපාදන ඕනි කියලා. ඒකට ඒගොල්ලෝ එකඟ වුණා. එතකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වතුර බෙදලම නැහැ මොකද අපි ඒක කරලා තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඩියුටිය කරලා තියෙන්නේ අපි. දැන් අපි ඉස්සරහට ඒක හදා ගන්න ඕනි. ඔය වගේ දේවල් ගොඩක් තියෙනවා. ඒ නිසා මගේ අදහසකුත් තියෙනවා මේ සභාවෙන් අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට අන්න ඒ වැඩමුළුව පවත්වන්න. දවස් 02ක් නම් තියන්න බැරි වෙයි ඒකේ සංක්ෂිප්තය හරි ඔබතුමන්ලාට ලබා දෙන්න තමයි මම හිතාගෙන ඉන්නේ.

ඊළඟට කියන්න තියෙන දේ තමයි පළාත් පාලන සතිය 15 වෙනිදා ඉඳන් ආරම්භ වෙනවා. 21 තමයි අවසන් වෙන්නේ. ඒක කරන්න හැමෝගෙම සහයෝගය ඕනි. ඒ නිසා එම වැඩසටහන් පෙළගැස්ම පිළිබඳ පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනි. ඒක මේ සභාව අවසන් වුණු ගමන්ම මෙතනට නිළධාරිනුත් සම්බන්ධ කරගෙන සාකච්ඡා මට්ටමින් පවත්වනවා. ඒ ඒ දිනවල පවත්වන වැඩසටහන්වලට අපි සහය දෙන්න ඕනි කොහොමද කියලා එතනදී ඔබතුමන්ලාට පැහැදිලි කිරීමක්

කරයි. ඒ වගේම අපේ බලන්ගොඩ ප්‍රාදේශීය සභාව හොඳම පළාත් පාලන සතිය ක්‍රියාත්මක කරපු ආයතන බවට පත් කරමු. ඒකේ ගෞරවය ඔබ අපි සියලු දෙනාටම තමයි ලැබෙන්නේ. එහෙනම් මගේ කතාව මෙතනින් අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම ස්තූතියි.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා** - ඉදිරිපත් වී නැත.

**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**
ඉදිරිපත් වී නැත

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - ඉදිරිපත් වි නැත.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂයේ ඒ ඒ ආදායම් ශීර්ෂවලට අදාළ ගාස්තු සංශෝධනය කිරීම සහ 2026 වර්ෂයේ ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අපි 2026 වර්ෂය සඳහා ආදායම් ගැසට් කරන්න ඕනි. ඒකට අදාළ ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත මෙතනට ලැබිලා තියෙනවා. එතකොට අපිට සිද්ධ වෙනවා පෙර වර්ෂයට අදාළ ඇතැම් ආදායම් ශීර්ෂ මේ වර්ෂයේදී සංශෝධනය කරගන්න. එතකොට ඒ ඒ ආදායම් ශීර්ෂ අවශ්‍ය පරිදි සංශෝධනය කරගෙන එම සංශෝධනවලට යටත්ව 2026 වර්ෂයේ ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත ත්‍රෛභාෂාවෙන් ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා**
ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
හරි මම මුලින්ම ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත ඔබතුමන්ලා ඉදිරිපත් කරන්නම්. ඉන් අනතුරුව මේ කෙටුම්පත සකස් වී ඇති ආකාරය, ඒ ඒ ආදායම් ශීර්ෂ සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳව ඔබතුමන්ලාට දැනුවත්භාවයක් ලබා දෙන්න ඕනි. මොකද අපි ඔබතුමන්ලාට මේ වන විට ලබා දීලා තියෙන ලිපි ලේඛන සමග මෙයට අදාළ කිසිඳු වාර්තාවක් ලබා දීලා නැති නිසා ඔබතුමන්ලාට මේ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගන්න අවශ්‍යයි. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා මෙම යෝජනාව පිළිබඳ සාකච්ඡා කරන්න සභාව කාරක සභාවක් බවට පත් කරන්න. අපි කාරක සභාවක් බවට පත් කරගත්තට පස්සේ අපිට පුළුවන් අදාළ සියළු නිළධාරීන් මේ ස්ථානයට කැඳවලා මේවා සංශෝධනය වෙන්න ඕනි ආකාරය සහ කෙටුම්පත සකස් වී ඇති ආකාරය පිළිබඳ සාකච්ඡා කරලා පැහැදිලි අවබෝධයක් ලබා ගෙන මේ කෙටුම්පත අනුමත කරන්න. ඒ නිසා මම මුලින්ම කෙටුම්පත සභාගත කරන්නම් .

**බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019-12-05 දිනැති 2152/45 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති මහජන සෞඛ්‍යයට අදාළ අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුව I වන උප ලේඛනයෙහි නිරූපිත යම් කාර්යයක් සඳහා බලන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් II වන උප ලේඛනයේ I වන තීරුවේ

යම් විෂයාංකයක වාර්ෂික වටිනාකම මත II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් අය කිරීම.

2026 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරමි.

## I වන උපලේඛනය

**අප්‍රසන්න ව්‍යාපාර**

| අනු අංකය | බලය දෙනු ලබන කාර්යය |
|---|---|
| 01 | හෝටලයක් පවත්වාගෙන යාම. |
| 02 | තේ කෝපි /සිසිල් බීම කඩ හා කෙටි ආහාර විකිණීම. |
| 03 | බේකරියක් පවත්වාගෙන යාම. |
| 04 | ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම. |
| 05 | සත්ත්ව ගොවිපලවල් පවත්වා ගෙනයාම. |
| 06 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 07 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 08 | එළවළු හෝ පළතුරු විකුණන ස්ථාන පවත්වාගෙන යාම. |
| 09 | උත්සවශාලා / නවාතැන්පලක් පවත්වාගෙන යාම. |
| 10 | ලැගුම්හල් හා නවාතැන්පල |
| 11 | ගල්වල හා ඇඹරුම්හල |
| 12 | රූපලාවන්‍යා මධ්‍යස්ථානය |
| 13 | සංචාරක වෙළදාම |
| 14 | පළතුරු බීම හා අයිස් පැකට් /සැලඩ් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 15 | සිල්ලර වෙළදාම |
| 16 | ලුණුදෙහි නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 17 | රසකැවිලි ,බයිට්,රටකජු නිපදවීම ගෙන්වා පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 18 | රස කැවිලි නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 19 | තේ කොළ පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 20 | කුළු බඩු පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 21 | බෙලිමල් පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 22 | පැණි හකුරු කිතුල්පිටි නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 23 | සුවඳ විලවුන් ,රෙදි සෝදන නිල් , හඳුන්කූරු, සබන්, රෙදිසෝදන කුඩු, විෂබීජ නාශක නිෂ්පාදනය හා ගබඩා කර අලෙවිය |
| 24 | උම්බලකඩ /කරවල පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 25 | සත්ත්ව ආහාර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 26 | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම. |
| 27 | ලෝහ සුන්බුන් තබාගැනීම හා අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 28 | ගෘහභාණ්ඩ /වේවැල්භාණ්ඩ,ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කර අලෙවිය |

| | |
|---|---|
| 29 | වඩු කර්මාන්තයක් සිදුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 30 | ටයර් ටියුබ් නිපදවීම හා වෝල්කනයිසින් කිරීම,ටයර් නැවත පිරවීම, |
| 31 | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 32 | බිම්මල් නිෂ්පාදනය හා පැකට් කර අලෙවිය. |
| 33 | ධාන්‍ය වර්ග ගබඩාකර පැකට් කර විකිණීම. |
| 34 | හඳුන්කූරු ,ඉටිපන්දම් ,ගම් වර්ග නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 35 | පානීය ජලය බෝතල් කර නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 36 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම. |
| 37 | පශු වෛද්‍ය සායන පවත්වා ගෙනයාම. |
| 38 | උළු ගඩොල් නිපදවීම හා අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 39 | භාවිතයට ගත් ගෝනි බැරල් හා භාජන පිරිසිදුකර විකිණීම. |
| 40 | බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 41 | අවමංගල්‍ය සේවයක් පවත්වාගෙන යාම. |
| 42 | මැණික් කැපීම හා ඔපදැමීම හා ස්වර්ණාභරණ නිෂ්පාදනය. |
| 43 | පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 44 | පොලිතින් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම. |

**අන්තරාදායක ව්‍යාපාර**

| | |
|---|---|
| 01 | යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම ආශ්‍රිත ලෑලි ,ලී කුඩු නිෂ්පාදනය හා අලෙවිය. |
| 02 | කොප්පරා නිපදවීම පොල්තෙල් ඇඹරීම ගබඩාකර තැබීම හා අලෙවිය. |
| 03 | මැටිභාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීම. |
| 04 | ටයර් ටියුබ් විකිණීමට ගබඩා කර තබාගැනීම. |
| 05 | කාඩ්බෝඩ් හා කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන පරණ පත්තර ගබඩා කර අලෙවිය. |
| 06 | බීඩි නිෂ්පාදනය හා ගබඩා කිරීම හා අලෙවිය. |
| 07 | වාහන අළුත්වැඩියා වාහන සේවා බදු කොටස් අළුත් වැඩියා සහ තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 08 | පාපැදි, යතුරුපැදි හා මෝටර් වාහන අළුත්වැඩියා කිරීම. |
| 09 | ඇගලුම් කර්මාන්තශාලා. |
| 10 | නිවාස වයරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 11 | කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 12 | හිස් ගෝනි,බෝතල් අබලි ද්‍රව්‍ය ටින්,ලෝහ රැස් කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 13 | තාර පෙරමුසු නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 14 | උකස්කරුවන් |
| 15 | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 16 | ශබ්ද වාහිනී ක්‍රියාකරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |

**අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර**

| | |
|---|---|
| 01 | ඉන්ජෙක්ටර් පොම්ප, රේඩියේටර් ,ශීතකරණ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 02 | විද්‍යුත් ලෝහ ආලේපන ,ලෝහවර්ග පෑස්සීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 03 | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය. |
| 04 | වාත්තු වැඩපලක් මෝටර් වාහන බොඩි තැනීම ,බෙලෙක්,ලෝහ පෑස්සීම ආශ්‍රිත ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 05 | බ්රේක් ලයිනර් කලච් ලයිනර් නිපදවීම හා අළුත්වැඩියාව. |
| 06 | විදුලි බුබුළු නිෂ්පාදනය හා අළුත්වැඩියාව. |
| 07 | කෙයොලින් මැටි, කැල්සයිට් ,ඩොලමයිට් කැඩීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 08 | කැල්සියම් කාබනේට් අවක්ශේපනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 09 | තිරුවානා ගල් කැඩීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 10 | කැල්සයිට්, ඩොලමයිට් ,ෆෙල්ඩ්පාර් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 11 | තිරුවානා, ඩොලමයිට් පිළිස්සීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 12 | ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙනයාම. |
| 13 | එළවළු, පළතුරු විජලනය කර ඇසුරුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 14 | බාබර් සාප්පු |

### II වන උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු 500.00 |
| රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 |
| රු.1500.00 ඉක්මවන අවස්ථාවක | රු.1000.00 |

### බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වන (1) වගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 152 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේදී පවත්වා ගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2026 ආදායම මෙහි I වන උපලේඛනයෙහි සඳහන් කාර්යයන් සඳහා II වන උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා නියම කිරීම.

2026 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරමි.

### I වන උපලේඛනය

| අනු අංකය | බලය දෙනු ලබන කාර්යය |
|---|---|

| | |
|---|---|
| 01 | ජංගම අලෙවිසැල් |
| 02 | මත්පැන් අලෙවිසැල් |
| 03 | බැංකු |
| 04 | පුද්ගලික අධ්‍යාපන ආයතන |
| 05 | සම්ප්‍රේෂණ කුළුණු |
| 06 | මිනි කෝප් සිටි/සමුපකාර ප්‍රාදේශික |
| 07 | රථවාහන කුලියට දීම |
| 08 | යන්ත්‍ර සූත්‍ර කුලියට දීම |
| 09 | අලෙවි නියෝජිත ආයතන |
| 10 | වාහන අලෙවි සැලක් පවත්වාගෙන යාම |
| 13 | ගොඩනැඟිලි ද්‍රව්‍ය අලෙවිය |
| 14 | ඉදිකිරීම් කටයුතු සිදු කිරීම |
| 15 | සැලසුම් ඇඳීම |
| 16 | කාර්මික උපකරණ කුලියට දීම |
| 17 | ඖෂධීය ශාක වර්ග අපනයනය කිරීම |
| 19 | ඉන්ධන පිරවුම්හල් |
| 20 | උත්සව අලංකරණය කිරීම |
| 21 | මෘදුකාංග නිෂ්පාදනය |
| 22 | දුරකථන /සිම්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 23 | පොල්ලෙලි කැබලි කර විකිණීම |
| 24 | අමු තේ දළු එකතු කිරීම |
| 25 | සුපිරි වෙළඳසැල් |
| 26 | මූල්‍ය උපදෙස් කාර්යාල |
| 28 | ග්‍රන්ථ ප්‍රකාශන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 29 | අනතුරුදායක ගස් ඉවත් කිරීම |
| 30 | භෝග නිෂ්පාදනය කිරීම |
| 31 | පරිසර හිතකාමී භාණ්ඩ අන්තර්ජාලය හරහා අලෙවිය |
| 32 | වීඩියෝකරණය හා නිෂ්පාදනය |
| 33 | ග්‍රොසරි |
| 34 | කැමරා උපකරණ කුලියට දීම හා අලෙවිය |
| 35 | නොදිරන කසල එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යෑම |
| 36 | ලිහිසි තෙල් අලෙවිය |
| 37 | සමාගම් |
| 38 | ගොඩනැඟිලි ද්‍රව්‍ය ප්‍රවාහනය |
| 39 | තොග වෙළඳාම |
| 40 | පෞද්ගලික ජල විදුලි බලාගාර |
| 41 | මාර්ගගත ක්‍රමය ඔස්සේ වෙළඳාම් සිදු කිරීම හා දැන්වීම් ප්‍රචාරය |
| 42 | පෞද්ගලික රෝහල් |

| | |
|---|---|
| 43 | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 44 | දර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 45 | ලිපි ද්‍රව්‍ය ,පොත් පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (බුක්ෂොප්) |
| 46 | රථ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 47 | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 48 | උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 49 | බටහිර ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 50 | ආයුර්වේද ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 51 | වෛද්‍ය මධ්‍යස්ථාන |
| 52 | විදුලි උපකරණ අලෙවිය |
| 53 | දුම්කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |

## II වන උපලේඛනය

| I තීරුව | II තීරුව |
|---|---|
| **2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම** | **රු .ශත** |
| රු 6000.00 නොඉක්මවන අවස්ථාවක | අයකිරීමක් නොමැත |
| රු 6000.00 ඉක්මවන එහෙත් රු 12000.00 නොඉක්මවන අවස්ථාවක | රු. 90.00 |
| රු 12000.00 ඉක්මවන නමුත් රු 18750.00 නොඉක්මවන විට | රු. 180.00 |
| රු 18750.00 ඉක්මවන නමුත් රු 75000.00 නොඉක්මවන විට | රු. 360.00 |
| රු 75000.00 ඉක්මවන නමුත් රු150000.00 නොඉක්මවන විට | රු. 1200.00 |
| රු 150000.00 ඉක්මවන විට | රු.3000.00 |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 150 (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වා ගෙන යනු ලබන මෙහි පහත I වන උපලේඛනයෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් II වන උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක වාර්ෂික වටිනාකම

මත II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතුය.

2026 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරමි.

## I වන උපලේඛණය

| අනු අංකය | කර්මාන්තය |
|---|---|
| 1 | වඩු කර්මාන්ත ශාලා / ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 2 | ලිපි ද්‍රව්‍ය ,පොත් පත් නිපදවීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 3 | රථ වාහන අමතර කොටස් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 4 | ඇස් කණ්නාඩි සකස්කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 5 | ගීත පටිගත කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 6 | ඇඳුම් මැසීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 7 | බෑග් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 8 | පාවහන් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 9 | පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 10 | ඡායා රූප ශාලාවක් පවත්වාගෙන යාම. |
| 11 | කෘෂි උපකරණ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 12 | කොසු සහ ඉදල් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 13 | විසිතුරු පැළ හා මල් නිපදවීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 14 | විසිතුරු භාණ්ඩ නිපදවීම අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 15 | නාම පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/ඩිජිටල් ප්‍රින්ට් |
| 16 | තේ පැළ තවන් කර අලෙවි කිරීම් ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 17 | විසිතුරු මත්ස්‍ය වගාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 18 | ගම්මිරිස් පැළ තවන් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 19 | හඳුන්කූරු පැකට් කිරීම හා අලෙවි කිරීම. |
| 20 | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 21 | තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම. |

| | |
|---|---|
| 25 | කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම. |
| 29 | කඩදාසි කවර නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 30 | පහන්තිර / පාපිසි නිෂ්පාදනය. |

## II වන උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු.500.00 |
| රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 |
| රු.1500.00 ඉක්මවන අවස්ථාවක | රු.1000.00 |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැඟිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2021 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව පදනම් කර ගනිමින් එම වාර්ෂික වටිනාකමින් සියයට (4%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයේ ජනවාරි මස 31වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් (10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් මුදල සියයට (5%) වට්ටමක් ලබා දීම.

**ඉහත කී උපලේඛනය**

| කාර්තුව | ගෙවිය යුතු දිනය | %5වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2026 මාර්තු 31ට පෙර | 2026 ජනවාරි 31ට පෙර |
| දෙවන කාර්තුව | 2026 ජුනි 30ට පෙර | 2026 අප්‍රේල් 30ට පෙර |
| තුන්වන කාර්තුව | 2026 සැප්තැම්බර් 30ට පෙර | 2026 ජූලි 31ට පෙර |
| හතරවන කාර්තුව | 2026 දෙසැම්බර් 31ට පෙර | 2026 ඔක්තෝබර් 31ට පෙර |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026වර්ෂය සඳහා වාර්ෂික අක්කර බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (03)වන උප වගන්තියේහි සඳහන් විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාළ සභා සීමා ඇතුළත පිහිටියා වූද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

හෙක්ටයාර් 1ට වැඩි එහෙත් හෙක්ටයාර් 05ට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වන සෑම හෙක්ටයාරක් සඳහාම රු 50.00ක්ද, හෙක්ටයාර් 05ට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් වැඩිවන සෑම හෙක්ටයාරයක් සඳහාම රු.10.00ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමත්,

තවද, 2026 වර්ෂයේහි පහත උප ලේඛනයෙහිසඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ මුදලින් සියයට පහක (5%)ක වට්ටමක් ලබා දීම.

**ඉහත කී උපලේඛනය**

| I වන තීරුව කාර්තුව | II වැනි තීරුව ගෙවිය යුතු දිනය | III වැනි තීරුව හිමිකම් වට්ටම් සඳහා %5 ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු කාර්තුව | 2026 ජනවාරි 01 - මාර්තු 31 | 2026 ජනවාරි 31ට පෙර |
| **දෙවන කාර්තුව** | 2026 අප්‍රෙල් 01 - ජුනි 30 | 2026 අප්‍රේල් 30ට පෙර |
| තුන්වන කාර්තුව | 2026 ජූලි 01 -සැප්.30 | 2026 ජූලි 31ට පෙර |
| සිව්වන කාර්තුව | 2026 ඔක්.01- දෙසැ.31 | 2026 ඔක්තෝබර් 31ට පෙර |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 147 හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම.

2026 වර්ෂය සඳහා පනවන ලද වාහන හා සතුන් පිළිබඳ බද්ද එම වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතුය.

**උපලේඛනය**

| | | රුශත . |
|---|---|---|
| මෝටර් රථයක් ,මෝටර් ලොරියක් ,මෝටර් කාරයක් ,<br>මෝටර් බයිසිකලයක් ,ජින් රික්ෂෝවක් ,කරත්තයක් ,<br>බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන<br>සෑම වාහනයක් සඳහා කාර්තුව | | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් ,<br>හෝ කරත්තයක් සඳහා -: | | |
| (අ) | වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) | වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| | සෑම කරත්තයක් සඳහා | 20.00 |
| | සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| | සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| | පෝනියකු හෝ කොටළුවකු සඳහා ,සෑම අශ්වයකු | 15.00 |
| | සෑම ඇතකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ “ වෙළඳ කාර්යය” යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන යටතේ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු නියම කිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%)වන බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය දහා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන “සමානුපාතය” වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ භූමි ප්‍රමාණය අතර අනුපාතය 5:1 විය යුතු යුතුය.

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 154(1) වගන්තියෙහි විධිවිධාන යටතේ ඉඩම් විකිණීම මත සඳහා බදු නියම කිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 154(1) වගන්තිය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉම් ඉඩමක වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙක් හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් හෝ විකුණනු ලබන අවස්ථාවකදී හෝ එම ඉඩමේ විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙක් හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු අතර පොදු කටයුතු සඳහා 10%ක ඉඩම් කොටසක් ලබා දිය යුතු බව 2026 වර්ෂය සඳහා බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් නියම කිරීම.

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් / දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව, 2026 වර්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් / දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව බදු පැනවීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව, 1988-08-23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා අතින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 09 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් / දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට පාරකට ඇළකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට අදාළව නියම කිරීම.

**ඉහත කී උපලේඛනය**

| | **විස්තරය** | **රු .ශත** |
|---|---|---|
| 1 | බිත්තියක් හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 70.00 |
| 2 | බිත්තියක හෝ පුවරුවක ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 120.00 |
| 3 | සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකටම | 70.00 |
| 4 | වෙළඳ ව්‍යාපාරික ස්ථානයේ ප්‍රචාරක පුවරුවෙහි තම වෙළඳ ව්‍යාපාරයේ නම ප්‍රචාරය කරනු ලබන ස්ථානය හැර ( උපරිම වර්ග අඩි 10ක ප්‍රමාණයට යටත්ව) ඊට අමතරව ප්‍රචාරය කරනු ලබන වෙළඳ ප්‍රචාරක දැන්වීම සඳහා සෑම වර්ග අඩියකටම | 10.00 |
| 5 | බිත්තියක් හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකයම -තාවකාලික දැන්වීම් පුවරු | 35.00 |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2025 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 11(1) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2026 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම නියම කිරීම.

**උප ලේඛනය**

01. ජල සහතිකයක් නිකුත් කිරීම සඳහා 500.00

02. විදුලි සහතිකයක් නිකුත් කිරීම 500.00

03. බලපත්‍රයක් පිට ඝාතනය කරනු ලබන එළ ගවයකු සඳහා 10000.00

04. බලපත්‍රයක් පිට ඝාතනය කරනු ලබන එළුවෙක් ගවයෙකු සඳහා 10000.00

05. අන්තරාදායක ගස් ඉවත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු 1000.00

06. මාර්ගය පළුදු කිරීමේදී ලබා ගන්නා ගාස්තුවෙන් ආපසු ලබා නොදෙන ස්ථාවර ගාස්තු 1000.00

07. එල් පී.වායු මඟින් ක්‍රියාත්මක මෘත දේහ දැවීම සඳහා වන ආදාහනාගාර ගාස්තු
   I. බල ප්‍රදේශය තුළ මරණ සඳහා 17000.00
   II. බල ප්‍රදේශයෙන් පිටත මරණ සඳහා 18000.00

08. තක්සේරු ප්‍රතිශෝධන ගාස්තු 1000.00

| අනු අංකය | විස්තරය | දැනට ලබා දෙන මිල රු. | සංශෝධනයට යෝජිත ගාස්තුව | මහ සභාව තීරණය කරන ලද මිල රු. 2026 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| 9 | ජේ.සී.බී. යන්ත්‍රය පැයක සේවා ලබා දීමට | 6000.00 | 6500.00 | |
| 10 | ට්‍රැක්ටරය දිනකට | 10500.00 | 10500.00 | |
| 11 | බේබි රෝල දිනකට (මාර්ග තලනය ටොන් එකහමාර) | 11500.00 | 10000.00 | |
| 12 | මාර්ග තලනය දිනකට (ටොන් 8-10) | 20700.00 | 18000.00 | |
| 13 | ජල බවුසරය (ජලය සමග)ලීටර් 6000 | 18400.00 | 14000.00 | |
| 14 | ජල බවුසරය (ජලය ලීටර් 3000) | 6000.00 | | |
| 15 | ජල බවුසරය (ජලය ලීටර් 3000) රදවා තබා ගැනීමට | 9000.00 | | |
| 15 | ටිපර් රථය දිනකට (ටොන් 10) | 24000.00 | 24000.00 | |
| 16 | ගලි බවුසරය ලීටර් 3000ක් බැහැර කිරීම - නිවෙස් | 13000.00 | | |
| 17 | ගලි බවුසරය ලීටර් 3000ක් බැහැර කිරීම - ව්‍යාපාරික | 15000.00 | | |
| 18 | ප්ලාස්ටික් පුටු එකක් සඳහා (දිනකට) | 10.00 | 15.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | කොඩි කණු එකක් සඳහා (දිනකට) | 10.00 | 30.00 | |
| 20 | ටකරන් තහඩු එකක් සඳහා (දිනකට) | 100.00 | 100.00 | |
| 21 | පාට පතාක කොඩි එකක් සඳහා (දිනකට) | 5.00 | 10.00 | |
| 22 | කථන මේසය (දිනකට) | 2500.00 | 2500.00 | |
| 23 | ශබ්ද වාහිනි යන්ත්‍ර දිනකට (ස්පීකර්) | 1500.00 | 1500.00 | |
| 24 | ශබ්ද වාහිනි යන්ත්‍ර දිනකට (බෆල්) | 2500.00 | 2500.00 | |

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම.**

1947 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ජීඑල්/7/3/4/49 හා 1999-11-24 දිනැති පළාත් සභා හා පළාත් පාලන ලේකම්ගේ ලිපියෙන් සංශෝධනය වූ පළමුවන වගන්තිය අනුව 2026 වර්ෂයට අදාළව විනෝද බදු නියම කිරීම.

**උපලේඛනය**

01. අලෙවි කරන ප්‍රවේශ පත්‍ර ආදායමෙන් 10%ක්

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2026වර්ෂය සඳහා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු අය කිරීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21,49,78 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988-08-23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලදුව (268 වැනි අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයට අදාළව පහත උප ලේඛනයේ පරිදි ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු නියම කිරීම.

**උප ලේඛනය**

01. ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම.

| ගෙබිම විශාලත්වය වර්ග අඩි | නේවාසික රු.ශත | වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා රු.ශත |
|---|---|---|
| 500 අඩු | 1.50 | 3.00 |
| 501-1000 | 1.80 | 3.50 |

| | | |
|---|---|---|
| 1001-2000 | 2.00 | 4.00 |
| 2001-3000 | 2.20 | 4.50 |
| 3001-5000 | 2.70 | 4.75 |
| 5001-7500 | 3.00 | 5.00 |
| 7501-10000 | 3.50 | 5.50 |
| 10000 ට වැඩි | 4.00 | 6.00 |

02.ගොඩනැගිලි සීමා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම රු.1000.00

03. පිඹුරු පතක් අනුමත කිරීම රු.300.00

04. ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර ගාස්තු රු.250.00

05. ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අයදුම්පත්‍ර ගාස්තු රු.25.00

06. අනුකූලතා සහතික පත්‍ර ගාස්තු රු.500

07. නාගරික සංවර්ධන අධිකාරි පනතට අයත් ප්‍රදේශ සඳහා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍රයක් නිකුත් කිරීම රු.500.00

09.නාගරික සංවර්ධන අධිකාරි පනතට අයත් ප්‍රදේශ සඳහාඉඩම් කට්ටි කිරීමේ අයදුම්පත්‍රයක් නිකුත් කිරීම රු.500.00

**සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

හරි එහෙනම් මේ පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරලා තීරණ වලට පැහැදිලි අවබෝධයකින් එන්න ඕනි නිසා මම මහා සභාව කාරක සභාවක් බවට පත් කරන්න යෝජනා කරනවා.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පෙ.ව.10.15ට මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව ලේකම්තුමිය විසින් අදාළ සියළුම නිළධාරින් එම ස්ථානයට කැඳවන ලදී. පසුව ඒ ඒ නිළධාරින් විසින් තම විෂය පථයන්ට අදාළව ආදායම් ශීර්ෂ සංශෝධනය විය යුතු ආකාරය සහ සංශෝධනය වන ආකාරය සභාව වෙත පැහැදිලි කරන ලද අතර ලේකම්තුමිය විසින් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව මේ වසරේ සංශෝධනය කළ හැකි සහ නොහැකි ආදායම් ශීර්ෂ පිළිබඳව ද ගාස්තු පනවන ආකාරයන් පිළිබඳවද පැහැදිලි කරන ලදී. අනතුරුව ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා නිළධාරින් සමග එක්ව ඒ ඒ ගාස්තු සංශෝධනයන්ට අදාළව ඒකමතික ලෙස තීරණවලට එළඹෙන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මම නැවතත් මෙම කාරක සභාව මහා සභාව බවට පත් කරන ලෙස යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා**

මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

- ඒ අනුව පෙ.ව.11.55 ට කාරක සභාව මහා සභාව බවට පත් කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

හරි එහෙනම් 2026 වසරේ ගාස්තු සංශෝධනය වන ආකාරය පිළිබඳව ඔබතුමන්ලාට පැහැදිලි අවබෝධයක් ලැබුණා. ඒ අනුව,

- අපි **2026 වසරේ වෙනත් ගාස්තු පැනවීම** යටතේ, එහි **උපලේඛන වල අනු අංක 09 සිට 24 දක්වා වූ ගාස්තු** සංශෝධනය කළා .

- ඒ වගේම **2026 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම** යටතේ, අලෙවි කරන ප්‍රවේශ පත්‍ර ආදායමෙන් 20%ක් ලෙස පැවති අය කර ගැනීම 10%ක් ලෙස සංශෝධනය කළා.

ඒ අනුව කාරක සභාවේදී සියලු දෙනාගේ එකඟතාවය මත සංශෝධනය කර ගන්නා ලද එම සංශෝධිත ගාස්තු ටික මම නැවත වරක් සභාව වෙත ඉදිරිපත් කරනවා.

| අනු අංකය | විස්තරය | දැනට ලබා දෙන මිල රු. | සංශෝධනය ට යෝජිත ගාස්තුව | මහ සභාව තීරණය කරන ලද මිල රු. 2026 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| 9 | ජේ.සී.බී. යන්ත්‍රය පැයක සේවා ලබා දීමට | 6000.00 | 6500.00 | 5500.00 |
| 10 | ට්‍රැක්ටරය දිනකට | 10500.00 | 10500.00 | 10500.00 |
| 11 | බේබි රෝල දිනකට (මාර්ග තලනය ටොන් එකහමාර) | 11500.00 | 10000.00 | 6000.00 |
| 12 | මාර්ග තලනය දිනකට (ටොන් 8-10) | 20700.00 | 18000.00 | 18000.00 |
| 13 | ජල බවුසරය (ජලය සමග) ලීටර් 6000 | 18400.00 | 14000.00 | 18000.00<br>(කි.මී.15ක් සඳහා පමණි.)<br>*වැඩිවන සෑම කි.මී.01ක් සඳහාම රු.50 බැගින් එකතු වේ. |
| 14 | ජල බවුසරය (ජලය ලීටර්3000) | 6000.00 | | 6000.00<br>(කි.මී.15ක් සඳහා පමණි.)<br>*වැඩිවන සෑම කි.මී.01ක් සඳහාම රු.50 බැගින් එකතු වේ. |
| 15 | ජල බවුසරය (ජලය ලීටර් 3000) රඳවා තබා ගැනීමට | 9000.00 | | 9000.00<br>(කි.මී.15ක් සඳහා පමණි.)<br>*වැඩිවන සෑම කි.මී.01ක් සඳහාම රු.50 බැගින් එකතු වේ. |
| 15 | ටිපර් රථය දිනකට (ටොන් 10) | 24000.00 | 24000.00 | 24000.00 |
| 16 | ගලි බවුසරය ලීටර් 3000ක් බැහැර කිරීම - නිවෙස් | 13000.00 | | |
| 17 | ගලි බවුසරය ලීටර් 3000ක් බැහැර කිරීම - ව්‍යාපාරික | 15000.00 | | |
| 18 | ප්ලාස්ටික් පුටු එකක් සඳහා (දිනකට) | 10.00 | 15.00 | 10.00 |
| 19 | කොඩි කණු එකක් සඳහා (දිනකට) | 10.00 | 30.00 | 30.00<br>***පහත පරිදි තැන්පතු රඳවා ගැනීමට යෝජනා විය**<br>➢ බට 50 සිට 100 දක්වා රු.10000.00<br>➢ බට 100 සිට 150දක්වා රු.25000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ➢ බට 150 සිට 200දක්වා රු.50000.00 |
| 20 | ටකරන් තහඩු එකක් සඳහා (දිනකට) | 100.00 | 100.00 | 100.00 |
| 21 | පාට පතාක කොඩි එකක් සඳහා (දිනකට) | 5.00 | 10.00 | 10.00 |
| 22 | කථන මේසය (දිනකට) | 2500.00 | 2500.00 | 2500.00 |
| 23 | ශබ්ද වාහිනි යන්ත්‍ර (ස්පීකර්) දිනකට | 1500.00 | 1500.00 | 2000.00 |
| 24 | ශබ්ද වාහිනි යන්ත්‍ර (බෆල්) දිනකට | 2500.00 | 2500.00 | 2500.00 |

➢ ඒ අනුව ඉහත සංශෝධිත ගාස්තුවලට යටත්ව 2026 වසරේ ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත ත්‍රෛභාෂාවෙන් ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත්වල අයිතිය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් 2025-03-14 දිනැති අංක 2427/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළමුවරට ගැසට් කරලා තියෙනවා. ඊට පස්සේ ඒ ගැසට් කරන ලද මාර්ගවලට විරෝධතා දැක්වීමටත් කාලයක් දීලා තිබුණා. එම කාලසීමාව 2025-06-14 දිනෙන් අවසන් වෙලා තියෙනවා. ඒ අනුව මේ මාර්ගවලට කිසිම විරෝධයක් පැමිණ නැති නිසා අපි මේ පාරවල් නැවත දෙවන වර ගැසට් කරන්න ඕනි. එතකොට මේ ගැසට් කරන මාර්ග මොනවද ඒ ටික ගැසට් කරන්නේ කොහොමද කියලා ඔබතුමන්ලාට අවබෝධයක් නැති නිසා ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගන්න මම මේ යෝජනාවටත් පෙර කළා වගේම කාරක සභාවක් බවට පත් කරන්න බලාපොරොත්තු වෙනවා.අපි ඒ විෂයට අදාළ නිළධාරිතුමාව කැඳවලා ඔබතුමන්ලාට අවබෝධයක් ඒ පිළිබඳව ලබා දෙනවා. ඒ අනුව අපි මේ යෝජනාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගන්න ඕනි. මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාළ ආකෘතියක් අපිට ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අනුව අදාළ ආකෘතිය සභාව වෙත ඉදිරිපත් කරන ගමන්ම මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලත් මම යෝජනා කරනවා.

**<u>දෙවන සභා යෝජනාවේ ආදර්ශය</u>**

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2022 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "සබරගමු පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වා ගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමයන් යටතේ, 2025 පෙරවාරි මස 07 වන දින පවත්වනු ලැබූ ප්‍රතිපත්ති සහ තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 22 දරන තීරණය අනුව, 2025 මාර්තු මස 14 වැනි සිකුරාදා දින ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් බළන්ගොඩ

ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

පළමුවන ගැසට් නිවේදනයේ ඇතුළත් කරනු ලැබූ සහ මෙතෙක් නඩු පවරා නැති පාරවල් සහ මාවත් වල ලේඛනය මේ සමග ඉදිරිපත් කරමි.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
දැන් මම මේ මහා සභාව කාරක සභාවක් බවට පත්කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා

- ❖ ඒ අනුව ප.ව.12.20 ට මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ විෂය භාර නිළධාරිතුමා විසින් මාර්ග ගැසට් කිරීම සිදු කළ ආකාරය සහ ගැසට් කරන ලද මාර්ග මොනවාද යන්නත් පිළිබඳව සභාව වෙත පැහැදිලි කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
දැන් මම මේ කාරක සභාව මහා සභාව බවට පත්කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා

- ❖ ඒ අනුව ප.ව.12.30 ට කාරක සභාව මහා සභාව බවට පත් කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මම හිතනවා ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට දැන් ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලැබෙන්න ඇති කියලා. මම විෂය නිළධාරිතුමාට කියන්නම් ඒ මාර්ග වසම් අනුව වෙන්කරලා ඔබතුමන්ලාට හඳුනා ගන්න පහසු විදියට සකස් කරලා දෙන්න කියලා.

- ➢ ඒ අනුව 2025 මාර්තු මස 14 වැනි සිකුරාදා දින ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇති නිවේදනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ විරෝධතා ඉදිරිපත්ව නොමැති මෙහි උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් දෙවන වර ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බලතල පැවරීමේ ලේඛනයේ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමන්ගේ නම සංශෝධනය කිරීමට අදාළ යෝජනාව

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අපි පසුගිය සභා වාරයෙන් බලතල පැවරීමක් සිදුකළා. එහිදී බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල මගින් එක් නිළධාරිතුමෙකුගේ නම වරද්දලා තමයි අපිට එවලා තියෙන්නේ. ඒ කියන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කේ.ඒ.එන්.අයි.වීසේකර මහතාගේ නම අපිට එවලා තියෙන්නේ කේ.ඒ.එන්.අයි.වීරකෝන් කියලා. ඒ නම නිවැරදිව සංශෝධනය කරලා දෙන්න කියලා අපිට

ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා**</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක කේ.ඒ.එන්.අයි.වීරසේකර මහතාගේ නම සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වැලිපතයාය කසළ අංගනය නිෂ්කාර්යව පැවතීම නිසා ඵලදායි ආර්ථික කටයුත්තක් සඳහා යොදවා ගැනීම සම්බන්ධ යෝජනාව

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
ඇත්තටම මේ වැලිපතයාය කසළ අංගනයක් පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළා. මහජන මුදල් වියදම් කරලා විශාල කසළ අංනයක් හදලා තියෙනවා. නමුත් අද කිසිදු පළ ප්‍රයෝජනයක් නැතිව නිකන්ම තියෙනවා. මේ නිසාම අපිට විගණනයේදීත් විශාල වශයෙන් ප්‍රශ්න මතු වුණා. මේකට විසඳුමක් හොයන්න ඕනි නිසාම අපි විවිධ කමිටුවලදීත් මේ ගැන කතා වුණා ඇත්තටම මේකට මොකද කරන්නේ කියලා. එතනදි අපිට යෝජනා කීපයක්ම ආවා. එකක් හඳුන්කූරු නිෂ්පාදනාගාරයක්, අනික සපත්තු හදන තැනක්, ඒ වගේම තව ආවා කිරි හරක් හඳන්න සුදුසු ස්ථානයක් කියලා. ඊට පසේ අපි ඒ කියන්නේ කොමසාරිස්තුමත්, මමත්, ලේකම්තුමියත්, අපේ නිළධාරිනුත්, උප සභාපතිතුමත්, මේ ස්ථානයට ගියා. පසුව ගම්වාසිනුත් එම ස්ථානයට කැඳෙව්වා. ඒගොල්ලන්ගේ විශාල විරෝධයක් තියෙනවා මෙතන කසළ අංගනයක් හදන එකට. ඒකේ යම් සාධාරණකමකුත් තියෙනවා. මොකද ඊට කලින් මෙතන කසළ අංගනයක් හදනවා කියලා, මෙතන කොම්පෝස්ට් පොහොර මධ්‍යස්ථානයක් හඳනවා කියලා තමයි මේ වැඩේ පටන් අරන් තියෙන්නේ. ඉන්පස්සේ වේළිඔය පොළේ තියෙන කසළ ටික ගෙනල්ලා එහෙමම මෙතනට දාලා. ඊට පස්සේ සත්තු ඒ මුළු පළාතේම කසළ ඇදගෙන ගෙනිහින් දාලා තියෙනවා. දුර්ගන්ධය විශාල වශයෙන් තිබිලා තියෙනවා. මෙන්න මේ හේතු නිසා ගම්වාසින්ගෙන් විරෝධතාවයක් තියෙනවා මේ කසළ අංගනයේ වැඩේට. කොහොමත් කසළ කිව්ව ගමන්ම මිනිස්සු විරුද්ධම තමයි. දැන් අපිට දෙහිගස්තලාවේත් එහෙම ප්‍රශ්නයක් තියෙනවා. හැබැයි අපි කසළ දාන්න හැදුවම කොහේ හරි ඊට පස්සෙ උද්ගෝෂණ. මේ නිසා අපි ලොකු ප්‍රශ්නෙකට මුහුණ දීලා තියෙනවා. ඒක නිසා මේ යෝජනාවට මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු උපසභාපතිබී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**</u>
ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ස්ථිර කරන ගමන්ම පොඩි අදහසක් දක්වන්න කැමතියි. ඇත්තටම මේ ස්ථානය වෙනත් ආර්ථීක කටයුත්තකට යෙදවීමට යෝජනා කිරීම පිළිබඳ මම ස්තුතිවන්ත වෙනවා. එතනදී අපිට කිරි ව්‍යාපාරික මහතෙකුගෙන් යෝජනාවක් ආවා එයාට කිරි හරක් ටිකක් ඇති කරන්න පුළුවන් කියලා. ඉතින් ඒ වගේ දේකටත් මේක යොදවන්න පුළුවන් නම් හොඳයි කියලා මම අදහස් කරනවා.ස්තුතිය.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
ඔව් ඒ පිළිබඳ යෝජනාවක් ආවා. ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි. මොකද ඒකට අවශ්‍ය පහසුකම් එතන තියෙනවා. වතුර තියෙනවා. ඉඩ පහසුකම් තියෙනවා. ගම්වාසින්ගෙන් විරෝධතාවක් එන්නෙත් නැහැ. අපි ඒ පිබඳවත් අවධානය යොමු කරමු.

- ඒ අනුව වැලිපතයාය කසළ අංගනය මේ වන විට නිෂ්කාර්යව පැවතීම නිසා ඵලදායි ආර්ථීක කටයුත්තකට යෙදවීම සඳහා අනුමැතිය ලබා ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන කසළ බඳුන් ස්ථාපනය සහ පෙට් බෝතල්, බියර් ටින් අලෙවි කිරීම -සිලෝන් එමරල්ඩ් වේ පුද්ගලික සමාගම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
අපේ සභාව කසළ කළමනාකරණ කටයුතු සඳහා රත්නපුර සිලෝන් එමරල්ඩ් වේ පුද්ගලික සමාගම එක්ක තමයි ගිවිසුම් ගත වෙලා ඉන්නේ. ඒ ගිවිසුම අනුව ඒගොල්ලෝ අපේ ආයතනට අයත් ස්ථානවල කසළ බඳුන් ස්ථාපනය කරලා ඒවායේ එකතු වෙන පෙට් බෝතල්, බියර් ටින් , ඒ වගේම අපිත් එකතු කරනවා ඒ වර්ග දෙකම ඒවාත් ඒගොල්ලෝ මිලදී ගන්නවා. එතකොට මේ ගිවිසුමේ කාලය 2025-09-01 දිනෙන් අවසන් වෙනවා. නැවතත් අපිට මේගොල්ලෝ එක්ක ගිවිසුම්ගත වෙන්න ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව කසළ බඳුන් ස්ථාපනය, පෙට් බෝතල්, බියර් ටින් අලෙවි කිරීම සඳහා සිලෝන් එමරල්ඩ් වේ ආයතන සමගම නැවත ගිවිසුම්ගත වීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන අපද්‍රව්‍ය කමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රාදේශීය කමිටු පිහිටු වීම සම්බන්ධ යෝජනාව**

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
අපිට අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවන්න කියලා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලිපියකින් දැනුම් දීලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබාදෙන්න කියලා මම යෝජනා කරන ගමන්ම පරිසර හා පොදු පහසුකම් කමිටුවේ සභාපතිතුමාට කියනවා ඒ පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න කියලා ඒක කොහොමද කරන්නේ කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.නන්දසිරි මැතිතුමා</u>
ගරු සභාපතිතුමනි, මම මුලින්ම මේ යෝජනාව ස්ථිර කරනවා. ඒ අනුව කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් මේ වෙනකොට හදලා තියෙනවා. ඒකෙදි පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කරමින් චක්‍රිය ආර්ථිකයක් නිර්මාණය කරන්න, ජාතික ප්‍රතිපත්තියක් විදිහට පළාත් පාලන ආයතන සතුව පවතින වගකීම් ඉටු කරන්නේ කොහොමද කියලා පැහැදිලි කරන්න 2025-04-02 දින සම්බන්ධීකරණ කමිටු රැස්වීමකුත් පවත්වලා තියෙනවා. ඒ අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රාදේශීය කමිටුවේ සංයුතිය සකස් වෙන ආකාරය අපිට ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සංයුතිය මෙන්න මේ විදියට තමයි සකස් වෙලා තියෙන්නේ,

- ✓ පළාත් පාලන ආයතනයන්හි නියෝජිතයන් ( ගරු නගරාධිපති/ සභාපති, මහජන නියෝජිතයින් සහ නිළධාරින්)
- ✓ ප්‍රාදේශීය ලේකම්
- ✓ පරිසර පොලීසිය
- ✓ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි ( මහජන සෞඛ්‍ය පරික්ෂක නිළධාරි ඇතුළුව)
- ✓ ගොවි ජන සේවා නිළධාරින්
- ✓ දිස්ත්‍රික් කෘෂිකර්ම නිළධාරි
- ✓ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය
- ✓ ප්‍රජා සංවිධාන / ස්වෙච්ඡා සංවිධාන

- ✓ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිළධාරින්
- ✓ වෙනත් සුදුසු නිලධාරින්

➢ ඒ අනුව ඉහත සංයුතිය ප්‍රකාරව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන කසළ කමනාකරණය වැඩකටයුතුවල නියුතු සේවක සේවිකාවන්ට නිළ ඇඳුම් දීමනාව ලබා දීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මේ යෝජනාවේ අන්තර්ගත වෙලා ඉන්නේ අපේ සෞඛ්‍ය කම්කරුවන් 03න් දෙනයි ඉන්නේ. ඒගොල්ලෝ කසළ කළමනාකරණ කටයුතුවලට අමතරව වෙනත් කටයුතුවලටත් සම්බන්ධ කරලා තියෙනවා. මම ඒ කසළ බැහැර කරන සේවක මහත්තුරුත් එක්ක සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවෙදි මම ඒගොල්ලන්ට කිව්වා තියෙන ගැටලු මට ඉදිරිපත් කරන්න කියලා. ඇත්තටම කණගාටුදායක දෙයක්. ඒගොල්ලන්ට අත්මේස් තිබුණේ නෑ හරියට තිබුණෙ රෙදි අත්මේස්. ඒවයින් අර කසළ තෝරන්න බැහැ. දැන් අද කිරිමැටිතැන්න පොළ. හෙට අනිවාර්යයෙන්ම කසළ ගෙනත් දානවා ඕතනට. එතකොට ඒ අයට නිළ ඇඳුම් නැහැ. ඉතින් ඒ අනුව අපි, ඒ අයට නිළ ඇඳුම් දීමනාවක් දෙන්න ඕනි අත්මේසුත් එක්ක. ඒවා ලබා දෙන්න ඕනි කොහොමද කියලා චක්‍රලේඛවලිනුත් අපිට පෙන්වලා දීලා තියෙනවා. ඉතින් චක්‍රලේඛවලට අනුගත වෙමින් මේ සේවක මහතුන්ට නිළ ඇඳුම් දීමනාව ලබා දෙන්න මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

➢ ඒ අනුව නිළ ඇඳුම් ලබා දීම සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව, අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන තන්ජන්තැන්න ක්‍රීඩා පිටියෙහි අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපිට කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලියුමක් එවලා තියෙනවා තන්ජන්තැන්න ග්‍රාම නිළිධාරි වසමෙහි, තන්ජන්තැන්න ක්‍රීඩා පිටිය නඩත්තු කරලා පවත්වා ගෙන යාම ඔවුන්ට කරන්න අපහසු නිසා එම ක්‍රීඩා පිටිය අපට පවරා දෙනවා කියලා. ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා හරහා අපට ඉල්ලීම් ලිපියක් එවන්න කියලා තියෙනවා. ඒ අනුව අපි පළාත් පාලන කොමසාරිස්තුමාගේ ඉල්ලීම් ලිපියක් එක්ක කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කරන්න ඕනි කඩිනමින් පවරා ගැනීමේ කටයුතු කරන්න. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ස්ථිර කරනවා. මේකේ පොඩි ගැටලුවක් තිබුණා. ඒක නිසා වෙන්න ඇති මෙතරම් කාලයක් ප්‍රමාද වෙන්න ඇත්තේ. මොකද මේකේ ගොඩනැඟිලි 02ක් තියෙනවා ක්‍රීඩා පිටිය පවතින කොටසට අයිති. ඒ දෙක සමිති 02ට අයිති වෙන්නේ. ඒ නිසා එම ගොඩනැඟිලි 02ක් ගැන හිතන්නේ නැතිව ක්‍රීඩා පිටිය ගැන විතරක් හිතන්න කියලත් මම යෝජනා කරනවා.

➢ ඒ අනුව තන්ජන්තැන්න ක්‍රීඩා පිටියෙහි අයිතිය සභාව වෙත පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන කරන පොදු කටයුත්තක් සඳහා ඉඩම් කැබලි අංක 09 යොදා ගැනීම සම්බන්ධ යෝජනාව.**

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මේ යෝජනාව අපිට අනදමෙත්පුර සුභ සාධක සමිතිය මගින් යොමු කරලා තියෙන්නේ. එතකොට මේ ඉඩම් විකුණන අවස්ථාවේදී ඉඩමේ අයිතිකරු පොදු කටයුතු වෙනුවෙන් කියලා ඉඩම් කොටසක් වෙන්කරලා තියෙනවා. ඔය ඉඩම් කට්ටි කරන කොට ඒ ඉඩම් කට්ටිකරුවන්ගේ පොදු අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් කොටසක් වෙන් කරනවා. ඒ වෙන් කරන ඉඩම් කොටස් ඒ ප්‍රදේශයේ තියෙන පළාත් පාලන ආයතනයට තමයි පවරන්නේ. එතකොට ඒ ඉඩම් කොටසේ ඉන්න අයගේ පොදු අවශ්‍යතාවලට තමයි අපි දෙන්න ඕනි. ඇත්තටම බැලුවොත් අපිට මේක හිසරදයක් වගේ පේනවා. මොකද අපිට ඕනි දේවල් ඒ කොටසේ කරන්න බැහැ. එතකොට මේ වෙන් කරලා තියෙන කැබලි අංක 09 තමයි පොදු කටයුත්තක් සඳහා ඉල්ලන්නේ. ඒ කියන්නේ ඔප්පු අංක 4759 යටතේ ප්ලෑන් අංක 2602 සහ 2228 යටතේ බෙදා වෙන් කරලා තියෙන ලොට් අංක 09 විදියට තියෙන කොටසේ තමයි මේ ප්‍රජා ශාලාවක් හදන්න අනුමැතිය දෙන්න කියලා කියන්නේ.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා**</u>
ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>
සභාපතිතුමා, පර්චස් කීයක් තියෙනවද ඔතන.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
පර්චස් 15 ක් තියෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>
අපි කලින් සභා වාරයේදීත් ඔතන ප්‍රජාශාලාවක් හදන්න හැදුවා. නිවාස වගයක් හදන්න හැදුවා.නමුත් අපිට ඒක කරන්න බැරි වුණා. ඔබතුමා දන්නවා ඇති ඔය කියන තැන. අර කන්ද උඩ තියෙන්නේ. එතන වටේ ඉඩම් ගොඩක් තියෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා**</u>
ඔය කියන තැන බිම් කොටස් 02ක් තියෙනවා. පර්චස් 10 එකයි. පර්චස් 15 එකයි.එතකොට ඔය කැබලි අංක 09 වෙන් කරලා තියෙන්නේ පොදු කටයුතුවලට.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>
එතකොට ඔය පර්චස් 10කොටසයි, පර්චස් 15 කොටසයි දෙකම ගන්නවාද. ඔය කන්දෙන් පහළ තියෙන පර්චස් 10 අපිට මොකුත් කරන්න බැහැ.එතකොට ඒ කොටස නිකන්ම අපතේ යනවා.ඉතින් ඔය පර්චස් 15ට ම අනිත් පර්චස් 10ත් එකතු කරලා අපිට ලොකු වැඩක් කරන්න පුළුවන්නේ. අර පර්චස් 15 විතරක් පාවිච්චි කළහම අනිත් පර්චස් 10 නිකන්ම අපතේ යයිද දන්නේ නැහැ. අත්‍යාවශ්‍ය දෙයක් කරනකොට තව පර්චස් 10ක් අපතේ යනවනම් ඒක අපරාධයක්.මිනිස්සු ඊට පස්සේ ඔතනට කුණු එහෙමත් දාන්න ලැස්ති වෙයි. ඔය පර්චස් 25 ආවරණය වන පරිදි දෙයක් කරන්න පුළුවන් නම් හොඳයි.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මන්ත්‍රීතුමා, අපි නෙමෙයි මේක හදන්නේ. මේ කැබලි අංක 09 ඉඩම් කොටසේ, ප්‍රජා ශාලාව ඒගොල්ලන්ට හදා ගන්න අපෙන් අනුමැතිය තමයි ඉල්ලන්නේ.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>
ඔතන ප්‍රජා ශාලාවක් හදන එක අත්‍යාවශ්‍යයි. හදනවනම් අර පර්චස් 10ත් බද්ධ කරගෙන මොනවා හරි කරන්න පුළුවන් නම් හොඳයි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා**</u>

මන්ත්‍රීතුමා මේ දෙක දෙපොළක තියෙන්නේ. පර්චස් 10 එකතැනක පර්චස් 15 තව තැනක. එතකොට මේ දෙක ඒකාබද්ධ කරන්න පුළුවන් තැන් දෙකක් නෙමෙයි. එකක් මීටර් 200ක් විතර පල්ලෙන් තියෙන්නේ. අනික ප්‍රධාන පාර අයින තියෙන්නේ. ඉතින් ඒ ගමට දැනට ප්‍රජා ශාලාවක් නැහැ. මොනවහරි රැස්වීමක් තිබ්බත් ඒක තියන්නේ සමිතියේ සභාපතිතුමාගේ ගෙදර. ඉතින් අපිට තියෙන්නේ මේ බිම් කොටස අනුමත කරන්න විතරයි. ශ්‍රම දායකත්වයයි, මූල්‍යමය දායකත්වයයි දෙකම දරන්නේ ඒගොල්ලෝ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>
මං කියන්නේ ඒගොල්ලෝ ඉල්ලන්නේ උඩ කොටසනේ. එතකොට පහළ කොටස නිකන්ම අපරාදේ වෙනවනේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා</u>
ඒත් ඒගොල්ලෝ අපෙන් ඉල්ලන්නේ එක බිම් කොටසයිනේ. කොටස් දෙකම ඉල්ලනවනම් අපිට දෙන්න පුළුවන්. අනිත් එක ඕක පොදු කටයුතු වෙනුවෙන්නේ වෙන් කරලා තියෙන්නේ.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
අපිට එහෙනම් එකතු කරන්න බැරි වෙනවා මන්ත්‍රීතුමා. අපි එහෙනම් මෙහෙ කරමු .ඔබතුමාත් පිළිගන්නවනේ මෙතන ප්‍රජා ශාලාවක් හදන එක අත්‍යාවශ්‍යයි කියලා. අපි ඔය ඉල්ලන ලොට් අංක 09 කොටසේ ප්‍රජා ශාලාව හදන්න අනුමැතිය දෙමු. අපෙන් ඒගොල්ලෝ ඉල්ලන්නේ එච්චරයිනේ. අපි ඊට පස්සේ මේ ගැන සභාවෙනුත් හොයලා බලමු. ඊට පස්සේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා කතා කරන කොට සමහර වෙලාවට රීතින්වලින් ඔබ්බට යනවා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට යම් ප්‍රශ්නයක් වෙනුවෙන් අදහස් දැක්වීම කරන්න පුළුවන් එක් අවස්ථාවයි. ඉතින් හැම වෙලාවේම ඒකත් ඔළුවේ තියාගන්න.

- ඒ අනුව ඔප්පු අංක 4759 සහ ප්ලෑන් අංක 2602 සහ 2228 යටතේ බෙදා වෙන් කරලා තිබෙන ලොට් අංක 09 ඉඩම් කොටසෙහි ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-10 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ප්‍රජා ශාලාවක් ඉදි කිරීමට අවසර ඉල්ලීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
මේකත් අර කලින් යෝජනාව වගේ එකක්මයි. කිරිමැටිතැන්න ග්‍රීන්රේන්ජ් ගමෙහි ප්‍රජා ශාලාවක් හදන්න අවසර ඉල්ලලා තියෙනවා. පවුල් 15ක් විතර මෙහි පදිංචියි කියලත් කියනවා.මේ ගමේ කෙළවරේ තියෙනවා අපේ සභාවට අයිති ඉඩමක් ඒකේ තමයි මේ ප්‍රජා ශාලාව හදන්න අවසර ඉල්ලලා තියෙන්නේ. ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව කිරිමැටිතැන්න ග්‍රීන්රේන්ජ් ගමෙහි සභාවට අයත් ඉඩම් කොටස, පොදු කටයුත්තක් බැවින් ප්‍රජාශාලාව ඉදි කිරීම සඳහා ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-11 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ අත්‍යාවශ්‍ය ඉතිරිවැඩ කොටස් නිම කර ගැනීම 04 වන අදියරය අවසන් බිල්පත ගෙවීම සඳහා වන යෝජනාව.**

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාව ඒ කියන්නේ අපි මේ ඉන්න ගොඩනැගිල්ලේ 04 වන අදිරයේ අවසන් බිල්පත ගෙවන්න අපිට අනුමැතිය ලැබිලා තියෙනවා. ඒ අනුව එම බිල්පතෙහි වටිනාකම වන රු. 1095176.27 මුදල විධායක අධ්‍යක්ෂ, සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරය වෙත ගෙවන්න මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ අත්‍යාවශ්‍ය ඉතිරිවැඩ කොටස් නිම කර ගැනීම - 04 වන අදියරය අවසන් බිල්පතෙහි වටිනාකම වන රු. 1095176.27 මුදල විධායක අධ්‍යක්ෂ, සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරය වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-12 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දාමහන ආදාහනාගාරයේ අළුත්වැඩියාව සඳහා වන ඇස්තමේන්තුව අනුමත කිරීම සහ සුදුසු ප්‍රසම්පාදන ක්‍රියාවළියක් මගින් අදාළ කාර්යය ඉටු කිරීම සඳහා වන යෝජනාව.**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
දාමහන අවට අයගෙන් නම් මේකට දැඩි විරෝධයක් තියෙනවා. දාමහන අපේ ගරු මන්ත්‍රීතුමා සහ ගරු මන්ත්‍රීතුමියත් ඉන්නවා. මේකේ දුම කාන්දු වෙන ප්‍රශ්නයක් තියෙනවා. අපිට ආරංචි විදියට දාමහන ප්‍රදේශයේ ප්‍රදේශවාසින් දාමහන ආදාහනාගාරයට යන්නෙත් නැහැ. අපි ඉක්මනට මේක හදා ගන්න ඕනි. ඒ නිසා මේක පත්තර වලින් ටෙන්ඩර් කැඳෙව්වොත් ලොකු මුදලක් යනවා හදා ගන්න. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මගින් පරීක්ෂා කරලා මේක අළුත්වැඩියා කරන්න අපිට රු.4311720.00 මුදලක් සහිත ඇස්තමේන්තුවක් එවලා තියෙනවා. ඒ වගේම මෙහි ලියාපදිංචි ඉදිකිරීම් කරුවන්ගේ නාම ලේඛනයකුත් අපිට එවලා තියෙනවා. මේකේ බලපත්‍රලාභීන් 14ක් ඉන්නවා. අපි මේ බලපත්‍රලාභීන්ගෙන් සීමිත මිල ගණන් කැඳවීමක් කරලා අළුත්වැඩියා කර ගන්න සහ මම අර කලින් කියපු ඇස්තමේන්තු මුදලට අනුමැතිය මේ ගරු සභාව මගින් තමයි ගන්න ඕනි. මේක අත්‍යාවශ්‍ය කාරණයක් හින්දා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය</u>**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

- ඒ අනුව දාමහන අදාහනාගාරයේ රු.4311720.00ක ඇස්තමේන්තු ගත මුදලට අනුමැතිය ලබා දීමටත්, නර්ඩ් ආයතනයේ ලියාපදිංචි බලපත්‍රකරුවන්ගෙන් සීමිත මිල ගණන් කැඳවා අදාළ අළුත්වැඩියා කටයුත්ත සිදු කිරීමට අනුමැතිය ලබා දීමටත්, මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## <u>හදිසි යෝජනා</u>

**06-13 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන පානීය ජලය බෙදා දීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ කාරණය සම්බන්ධව අපිට ලියුම් ගොඩාක් ඇවිල්ලා තියෙනවා. ඒ වග්ම අපේ මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීම් ආවා. මේ දවස්වල නියඟය තියෙනවා. විශේෂයෙන්ම ළිං හිදිලා තියෙනවා. ඒ වගේම ප්‍රජා ජලවලින් වතුර ගත්ත අයටත් මේ දවස්වල වතුර නැහැ. වහින කාලෙට වතුර තියෙනවනම් අපි ඒ තියන තැනක ප්‍රජා ජලය කියලා එකක් හදා ගන්නවා. ඊට පස්සේ පායන කොට වතුර නැහැ. ඒ නිසා මේවට මුහුණ දෙන්න වෙන්නේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට. එතකොට මේවර කල් සම්ප්‍රදායකක් විදියට කළේ මොකක්ද අපි වෙනත් ආයතනයකට භාර විෂයක් අපි විෂය බලෙන් පවර ගෙන අපි ඒක කළා. ඒක අපේ පනතට අනුකූල නැත. ඒ නිසා අපි මේක නැවැත්වුවා. නමුත් අපිට දිගින් දිගටම යෝජනා එනවා. ඊට පස්සේ අපි ගරු ආණ්ඩුකාරතුමියව දැනුවත් කළා. ඊට පස්සේ මේක හදිසි අවශ්‍යතාවයක් සහ මානුෂීය කාරණයක් සේ සළකලා අපි මේකට ක්‍රමවේදයක් සකස් කර ගන්නකම් ජනතාවට ජලය බෙදන්න තීරණය කළා. ඒක නිසයි අපි මේ යෝජනාව හදිසියේම සභාවට ගෙනාවේ. බල ප්‍රදේශයේ ජනතාවට මේ සේවය ලබා දෙන්න ඕනි. නීතිමය රාමුවත් රැකගෙන, මානුෂීයත්වය සළකලා අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ක එකතුවෙලා මේකට නිසි ක්‍රමවේදයක් හදා ගන්නකම් සභාව මගින් ජලය බෙදන්න අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව නිසි ක්‍රමවේදයක් සකස් කර ගන්නා තුරු, නියං කාලසීමාවන් වලදී පානීය ජල අවශ්‍යතා සපුරාලීමට ජලය බෙදා දීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>07. කාරක සභා වාර්තා</u>**

**07-01 ටෙන්ඩර් කමිටු වාර්තාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2025-08-13 දිනැති ටෙන්ඩර් කමිටු වාර්තාව ඔබ සියලු දෙනාටම ලබා දීලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025-08-13 දිනැති ටෙන්ඩර් කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07-02 මුදල් කමිටු වාර්තාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2025-08-28 දිනැති මුදල් කමිටු වාර්තාව ඔබ සියලු දෙනාටම ලබා දීලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025-08-28 දිනැති මුදල් කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07-03 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
2025-08-03 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඔබ සියලු දෙනාටම ලබා දීලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025-08-03 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ඔබ සියලු දෙනාටම ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා ලබා දීලා තියෙනවා 2025 අගෝස්තු මාසයට අදාළව. එම වාර්තා 02 සඳහාම ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025 අගෝස්තු මස ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**
ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි. සභාපතිතුමා අපේ හැඳුනුම්පත් ඉක්මනින් හදාගන්න පුළුවන් නම් හොඳයි. මං දැක්කා රත්නපුර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට ඒක ලබා දීලා තියෙනවා.අනික කවරින් ලෙටර්ස් ටික. අපි කලිනුත් ඒ ගැන මතක් කළා. ඒකත් ඉක්මනට කරලා දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**
ගිය සතියේ අපේ සභාවේ වැඩ කරපු අපේ සභාවේ කාලයක් තිස්සේ සේවය කරන පුෂ්පේ ඒ වගේම ඔහුගේ බිරිඳ අපේ මන්ත්‍රීතුමියක්. එතුමියගේ සහෝදරියගේ මළගෙයක් වුණා. මං හිතන්නේ සභාවේ සුභ සාධක සමිති 02ක් තියෙනවා. ඒ දෙකෙන් එක බැනරයක්වත් තිබුණෙ නැහැ. මං හිතන්නේ මෙතන ඉන්න අයගෙනුත් බොහෝම සුළු පිරිසක් තමයි ඒකට සහභාගි වෙලා තියෙන්නේ. ඒකට කමක් නැහැ. නමුත් මෙතන අවුරුදු 30ක් සේවය කරලා මේ සභාව වෙනුවෙන් තම ශ්‍රමය , කාලය කැප කරපු කෙනෙක් වෙනුවෙන් මීට වඩා ගෞරවයක් දෙන්න ඕනි කියලා මං හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**
ගරු සභාවෙන් අවසරයි. දැන් අපිට වට්ස් ඇප් සමූහය තියෙනවා. ඒ වගේ දෙයක් වුණාම ඒ සමූහය හරහා දැනුවත් කළා නම් හැමෝම දැන ගන්නවා. ඒ නිසා පක්ෂ විපක්ෂ කියලා බලන්නේ නැතිව ඒ වගේ දෙයක් තියෙන කොට ඒ සමූහයට යොමු කරන්න. එතකොට අපිට සම්බන්ධ වෙන්න පුළුවන්. දැන් අර කිත්සිරි මන්ත්‍රීතුමාගේ මළ ගෙදරක් වුණා. ඒක වට්ස්ඇප් දාලා තිබුණා. මං ඒ මළ ගෙදරට සහභාගි වුණා. ඒ නිසා මං සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙන් සහ තුමියන්ලාගෙන් ඉල්ලා සිටින්නේ ඔබතුමන්ලාගේ එහෙම මොනවහරි තියෙනවනම් මෙම සමූහයට යොමු කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා**
කල්තොට ප්‍රදේශීය ලේකම් කාර්යාලය අලුතින් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමට පළමුවෙන්ම තෝරා ගැනීම වෙනුවෙන් මම නව රජයට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මේ සඳහා මූලිකවම කටයුතු කරපු, මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්න කටයුතු කරපු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල

එල්ලාවල මැතිතුමාටත්, ඒ වගේම හිටපු ප්‍රාදේශීය ලේකම්තුමියටත්, ඒ වගේම ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා කටයුතු කරපු හිටපු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් මේ අවස්ථාවේ මම ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම මම විශේෂ අදහසක් ඉදිරිපත් කරනවා අපේ ගරු උප සභාපතිතුමාත්, කසළ අංගනය වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති යෝජනාවක් ගෙනවා. ඒකෙ කිරිගව පාලනයක් වගේ දෙයක් කරනවනම් ඇත්තටම හොඳයි. ඒ ප්‍රදේශයට කොම්පෝස් පොහොර අවශ්‍යතාවය තියෙනවා විශාල වශයෙන්ම. ඒකත් එක්ක කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනාගාරයක් වගේ කරන්න පුළුවන් නම් වඩාත් වටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

අපේ දෙහිගස්තලාව කොට්ඨාශයේ මුස්ලිම් කොළණියේ පාරක් දාලා තිබුණා හදන්න. එතන පාරක් හදන කොට ඒකට අදාළ නිර්ණායක ටිකක් තියෙනවා කිව්වා. ඒ වගේම එතන කෘෂිකර්මයට අයිති කුඹුරක් තියෙනවා කියලා තමයි කිව්වේ. ඒත් දැන් එතන කුඹුරක් නැහැ. එතකොට ඒගොල්ලෝ මට කිව්වා මන්ත්‍රීතුමා මෙන්න මෙහෙම පාරක් හදනවා, ඔබතුමාට එතනට පොඩ්ඩක් ඇවිල්ලා යන්න එන්න පුළුවන්ද කියලා. නමුත් මට එතනට යන්න අවස්ථාවක් වුණේ නැහැ. දැන් ඒ පාර කැන්සල් වෙලා තියෙනවා. ඒ ගොල්ලෝ කියන්නේ එතන රබර්, තේ එහෙම නැත්තම් කුඹුරක් වගේ කෘෂිකාර්මික කටයුත්තක් කරනවනම් තමයිලු පාරක් හදන්න පුළුවන්. ඒගොල්ලන්ගේ නිර්ණායක වල තියෙන්නේ එහෙම දෙයක් තියෙනවනම් විතරයිලු පාර හදන්න පුළුවන් කියලා. තේ හරි රබර් හරි අක්කර ගානක් තියෙනවා ඒවා ප්‍රවාහනය කරන්න පාරක් ඕනි කියලා පෙන්නන්න ඕනිලු. එතකොට අපේ කොට්ඨාශේ ඒ විදියට රබර් , තේ , කුඹුරු එහෙම නැනේ සභාපතිතුමා. එතකොට අපිට පාරක් හදලා සංවර්ධනය කරන්න විදියක් වෙන්නෙම නැහැ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපි දැන් අවුරුදු 05ක සැලැස්මක් හදනවා. අපි ඒකෙදී ඒ ඒ වසමේ තියෙන සියලුම දේවල් ඒ සැලැස්මට ඇතුල් කරනවා. ඒ වසමේ ඉන්න සියළුම නිළධාරින් ඒ කියන්නේ ග්‍රාම සේවක, ආර්ථික සංවර්ධන නිළධාරි ඒ වගේම දේශපාලන අධිකාරිය කියන මේ සියලුම දෙනා එකට එකතු වෙලා තමයි මේ සැලැස්ම හදන්නේ. මං තලංගම ගියාම එහේ ග්‍රාම නිළධාරිතුමිය කිව්වේ තාම හදලා ඉවර කළේ නැහැ. ඒක ඒ තරමම සංකීර්ණයි කියලා. මොකද අපි මේක හදන්නේ අවුරුදු 05ටනේ. අපේ තේමාව වෙන්නේත් පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්. ඒනිසා අපි හැමෝම එකට එකතු වෙලා වැඩ කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, අපි රුපියල් ලක්ෂ 10ක මුදලක් වෙන් කරනවා හැම වසමකටම කෘෂිකාර්මික ප්‍රවේශ මාර්ග කියලා. ඉතින් දෙහිගස්තලාව වසමේ එහෙම කෘෂිකාර්මික ප්‍රවේශ මාර්ගයක් කියලා ගන්න තැනක් තිබුණේ නැහැ.එතකොට අපිට පෙන්නපු කුඹුරුයාය දැන් අත්ඇරලා දාලා තියෙන නිසා ඒක අනුමත වුණේ නැහැ. ඒ ස්ථානයට අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත්, කෘෂිකර්ම පර්යේෂණ නිළධාරිතුමියත්, ග්‍රාම නිළධාරිතුමියත්, කාර්මික නිළධාරිතුමියත්, කියන ඔය කට්ටියම ගියා. නමුත් අර නිර්ණායකවලට අනුකූල නැති නිසා තමයි ප්‍රතික්ෂේප වුණේ. ඒ නිසා අපි එම මුදල වෙන තැනකට යොමු කළා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය</u>**

ගරු සභාපතිතුමනි පසුගිය මාසේ 29 වෙනිදා මගේ සහෝදරිය අභාවප්‍රාප්ත වුණා. ඒ අවස්ථාවට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම සභිකවරුන් සහභාගි වුණා. ඒ වෙනුවෙන් මම සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ඒ අවස්ථාවට සම්බන්ධ වුණු අපේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත් සහභාගි වුණා. ඒ සියළුම දෙනාටත් මගේ ස්තුතිය පුද කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මගේ පියාගේ අවමංගල්‍යයට සහභාගි වුණු අපේ සියළුම මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

ඒ අනුව සභාවේ කටයුතු ප.ව. 1.30ට අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව